# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1659/17 - 2010 ජුනි 23 වැනි බදාදා - 2010.06.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත

3 වැනි වගන්තිය යටතේ වූ නියමය

1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, යථෝක්ත පනතේ 3 වැනි වගන්තිය යටතේ 2009.03.26 දිනැති අංක 1594/23 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලද නියමයන් එකී නියමයන්ට වූ උපලේඛනයෙහි දැක්වෙන පහත සඳහන් භාණ්ඩ ඉවත් කිරීම මගින් සංශෝධනය කරනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි.

මහින්ද රාජපක්ෂ,<br>
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2010 ජුනි මස 23 වැනි දින,<br>
කොළඹ,<br>
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

| *I* *ශීර්ෂ අංකය* | *II* *සංයෝජිත වර්ගීකරණ සංකේතය* | *III* *විස්තරය* | *IV* *නිෂ්පාදන බදු ප්‍රතිශතය* |
|---|---|---|---|
| 24.02 | 2402.20.20 | දිගින් මි.මී. 60 නොඉක්මවන සිගරට් | සිගරට් 1000 ට රු. 2,289/- |
| | 2402.20.30 | දිගින් මි.මී. 60 ඉක්මවන එහෙත් මි.මී. 67 නොඉක්මවන සිගරට් | සිගරට් 1000 ට රු. 5,706/- |
| | 2402.20.40 | දිගින් මි.මී. 67 ඉක්මවන එහෙත් මි.මී. 72 නොඉක්මවන සිගරට් | සිගරට් 1000 ට රු. 8,485/- |
| | 2402.20.50 | දිගින් මි.මී. 72 ඉක්මවන එහෙත් මි.මී. 84 නොඉක්මවන සිගරට් | සිගරට් 1000 ට රු. 10,715/- |
| | 2402.20.60 | දිගින් මි.මී. 84 ඉක්මවන සිගරට් | සිගරට් 1000 ට රු. 12,170/- |

07-300/1

1A - G 13031 — 1,330 (2010/06)

## 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත

3 වැනි වගන්තිය යටතේ වූ නියමය

1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, මීට අමුණා ඇති උපලේඛනයේ III වැනි තීරුවේ නිශ්චිතව දක්වා ඇති සෑම භාණ්ඩයක් සඳහා ම උපලේඛනයේ ඊට අනුරූප සටහනේ IV වැනි තීරුවෙහි නිශ්චිතව සඳහන් නිෂ්පාදන බදු අනුප්‍රමාණයන් 2010 ජුනි මස 24 වැනි දින සිට ගෙවිය යුතු බව මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.

2010 ජුනි මස 23 වැනි දින,
කොළඹ,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

### උපලේඛනය

| *I* *ශීර්ෂ අංකය* | *II* *සංයෝජිත වර්ගීකරණ සංකේතය* | *III* *විස්තරය* | *IV* *නිෂ්පාදන බදු ප්‍රතිශතය* |
|---|---|---|---|
| 24.02 | 2402.20.20 | දිගින් මි.මී. 60 නොඉක්මවන සිගරට් | සිගරට් 1000 ට රු. 2,830/- |
| | 2402.20.30 | දිගින් මි.මී. 60 ඉක්මවන එහෙත් මි.මී. 67 නොඉක්මවන සිගරට් | සිගරට් 1000 ට රු. 6,246/- |
| | 2402.20.40 | දිගින් මි.මී. 67 ඉක්මවන එහෙත් මි.මී. 72 නොඉක්මවන සිගරට් | සිගරට් 1000 ට රු. 9,028/- |
| | 2402.20.50 | දිගින් මි.මී. 72 ඉක්මවන එහෙත් මි.මී. 84 නොඉක්මවන සිගරට් | සිගරට් 1000 ට රු. 11,260/- |
| | 2402.20.60 | දිගින් මි.මී. 84 ඉක්මවන සිගරට් | සිගරට් 1000 ට රු. 13,170/- |

07-300/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.